**ඉමදූව ප්‍රාදේශීය සභාව- 2022**
**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අකුරැස්ස කළාප අධ්‍යාපන කාර්යාලයෙන් සේවක ණය ශේෂ පියවීමට ලද රු.76,100 ක මුදල සේවක ණය ගෙවීමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.148,928 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිම කර බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු කර්මාන්ත 03 ක් රු.1,205,635 ක කර්මාන්ත ණයහිමි ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂවලට අදාළව ගිණුම් ගතකර තිබූ රු.18,425,080 ක් වූ ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර සහ රු.22,473,223 ක් වූ කර්මාන්ත ණයහිමියන් සමාලෝචිත වර්ෂයේ දී ද ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.7,821,797 ක් ද, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.621,794 ක් හා ලී බඩු හා සවිකිරීම් වටිනාකම රු.40,000 ක් ද ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | මෝටර් රථ හා කරත්ත යටතේ රු.60,050 ක පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 16 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.68,800,684 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.72,254,050 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අදාළ ශේෂ පිළිබඳ වාර්තාවක් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ද ඉදිරිපත් කර ඇති අතර අවසන් තීරණයක් ලැබී නොමැති බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 හා 24 වගන්ති | සභාව සතු පාරවල් 113 ක් සඳහා මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කර නොතිබුණි. | පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකර ඇති අතර ඉතිරි මාර්ග මැනුම් කිරීම ඉදිරියේදී සිදුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | 2022 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා අවසන් වාර්තා සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කමිටුවක් පත්කර පරීක්ෂණයක් සිදුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,273,156 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,967,416 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,920,600 | 4,131,840 | 4,314,319 | 2,058,704 | 1,800,000 | 2,469,788 | 2,472,788 | 2,241,183 |
| බදු කුලී | 4,411,000 | 1,889,800 | 1,889,800 | - | 4,611,000 | 1,682,290 | 1,682,290 | - |
| බලපත්‍ර | 927,200 | 1,434,171 | 1,448,671 | 100,100 | 893,970 | 687,127 | 687,127 | 114,600 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ගාස්තු වෙනත් ආදායම් | 6,847,700 | 6,305,641 | 6,313,776 | 299,430 | 10,910,180 | 4,254,981 | 6,629,500 | 307,565 |
| | -------------- | -------------- | -------------- | ------------- | ------------- | -------------- | ------------- | ------------ |
| | 15,106,500 | 13,761,452 | 13,966,566 | 2,458,234 | 18,215,150 | 9,094,186 | 11,471,705 | 2,663,348 |
| | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======= |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.2,663,348 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.2,458,234 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.93,480 ක් ලැබිය යුතුව තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) සභාව සතු කඩ කාමර 12 කින් හිඟ එක්වන් මුදල් ලෙස 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.7,347,724 ක් අයවීමට තිබුණි. | පිළිතුර ලබාදී නැත. | හිඟ එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඉසුසු කැබ් රථය අළුත්වැඩියාව සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුගෙන් 2018 වර්ෂයේ වාර්තාවක් ලබාගෙන තිබුණ ද, අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | තාවකාලිකව මෙම කාර්යය සිදු කිරීම නවතා ඇති බව. | වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෝගහගොඩ සතිපොළ ඉදිකිරීම් හා නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.5,181,800 ක වියදමක් සභාව විසින් දරා තිබුණ ද, ව්‍යාපෘතිය අවසන් වී නොතිබුණි. | මේ වන විට භූමියේ පස් පරීක්ෂාව සිදු කර ඇති බව. | ව්‍යාපෘති ඉටු කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | බෝගහගොඩ සතිපොළ වෙළඳ කුටි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,500,000 ක් අනුමත කර තිබුණ ද, ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | රට තුළ පවත්නා භාණ්ඩ මිල උච්චාවචනයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා ඉදිරිපත් නොවූ බව. | - එම - |